# 2.54 ජංගම දුරකථන තුළින් අන්තර් සබඳතාවලට සිදුවන බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩී.ජී. සුරංජි සේපාලිකා කුමාරි[1], අයි.පී.එම්.සෙව්වන්දි චන්ද්‍රසෝම[2]
විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

සන්නිවේදන උපකරණ ලොවට හඳුන්වා දීමත් සමග 1940 දශකයේ දී පමණ 'ජංගම දුරකථනය ලොවට හඳුන්වා දී ඇත. බහරේන්, ටෝකියෝ, ඔසාකා, මෙක්සිකෝ ආදි ලොව පුරා ප්‍රචලිත නගරවල ප්‍රථමයෙන් ජංගම දුරකථන ජාලය ව්‍යාප්ත කළේ ඇමරිකාව මඟිනි. මීට වසර කීපයකට පෙර මෙම ජංගම දුරකථන අදහස් හුවමාරු කිරීමට පමණක් භාවිතා කර ඇතත් නවීනතම ජංගම දුරකථන තුළින් අදහස් හුවමාරුව, දත්ත, තොරතුරු, රූප ඇතුළු විශාල තොරතුරු ප්‍රමාණයක් සන්නිවේදනය කළ හැකිව ඇත. තොරතුරු සන්නිවේදනය උදෙසා වූ නවීනතම උපකරණය ලෙස ඒ අනුව ජංගම දුරකථනය හැඳින්වීමට පුළුවන.

මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වූයේ ජංගම දුරකථන භාවිතය තුළින් අන්තර් සම්බන්ධතාවලට සිදුවන බලපෑම කෙබඳුද? යන ගැටළුව පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකිරීමටයි. මෙහිදී මෙකී පර්යේෂණයේ අරමුණු ලෙස ජංගම දුරකථන භාවිතය පුළුල් වී ඇති ආකාරය සොයා බැලීමත්, මෙම උපකරණය භාවිතයට පෙර අන්තර් සබඳතා පැවැත් වූ ආකාරය, ඒවායේ තිබූ ක්‍රමවත් බව මෙන්ම ජංගම දුරකථනය හඳුන්වා දීමෙන් පසු ඇති වූ විපර්යාසයන් වාසි සහ අවාසිත් එම හඳුන්වා දීම තුළින් පුද්ගල අන්තර් සබඳතාවලට සිදු වූ බලපෑම හිතකරද අහිතකරද යන්නත් ජංගම දුරකථන භාවිතා කරන්නන් හා නොකරන්නන් මඟින් ඔවුන්ගේ අන්තර් සබඳතාවල ස්වභාවයත් අධ්‍යයනය කරන ලදී. මෙම පර්යේෂණයට අදාළ ක්‍රමවේදය ලෙස භාවිතා කරන ලද්දේ තුලනාත්මක ක්‍රමවේදය හා කෘත්‍යාත්මක ක්‍රමවේදය යි. මීට අදාළ දත්තයන් සපයා ගැනීමේ ශිල්ප ක්‍රම ලෙස සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා නිරීක්ෂණ ක්‍රමය අනුගමනය කොටගෙන ගුණාත්මක දත්ත රැස් කර ගන්නා ලදී. සසම්භාවී නියැදි ක්‍රමය උපයෝගී කර ගනිමින් පුද්ගලයන් 125 දෙනෙකු පර්යේෂණ නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී.

මේ අනුව ජංගම දුරකථන භාවිතය තුළින් අන්තර් සබඳතාවලට ඍජුවම බලපෑම් එල්ල වන බව පැහැදිලි විය. එම බලපෑම හිතකර මෙන්ම අහිතකර යන දෙයාකාරයෙන්ම සිදුවන බව ලබාගත් දත්තයන්ට අනුව දැකගන්නට ලැබුණු අතර කෘත්‍යාත්මක වශයෙන් විමසා බැලීමේදී ජංගම දුරකථන තුළින් අන්තර් සබඳතා වලට, සිදුවන බලපෑම හිතකර බව ලබාගත් අවසන් නිගමනයි. තොරතුරු සන්නිවේදනයේදී ක්‍රමවත් භාවයකින් යුක්තව හා මනා අවබෝධයකින් යුක්තව ජංගම දුරකථන භාවිතා කිරීම වැදගත් බව ද පෙනී ගිය කරුණකි.

**Key words:** ජංගම දුරකථනය, අන්තර් සම්බන්ධතා, සන්නිවේදනය, බලපෑම, භාවිතය